කාර්ය සාධන වාර්තාව

2019

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමන්ගේ පණිවුඩය



ශ්‍රී ලාංකේය ජන සමාජයේ උන්නතිය උදෙසා බිහි වූ සමුපකාර ව්‍යාපාරය නඟා සිටුවීම සඳහා කැපවන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) 2019 වර්ෂය සඳහා සකසනු ලැබූ කාර්ය සාධන වාර්තාව ඔබ අතට පත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

"ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය" යන්න දැක්ම කර ගනිමින් සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා පුළුල්ව මැදිහත් වීම, මෙහෙවර කර ගත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ලාංකේය සාමාන්‍ය ජන ජීවිතය හා අවියෝජනීයව බැඳී පවතී. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) ව්‍යුහය හා කාර්යභාරය පිළිබඳවත් අභ්‍යන්තර පරිපාලනය, මානව සම්බන්ධතා සංවර්ධනය සහ විගණන කටයුතු, නීති කටයුතු පිළිබඳවත් මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරය ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සානුබල සපයමින් සමුපකාර ආයතන වල යහපාලනය ගොඩ නැඟීම සඳහා පුළුල් ලෙස මැදිහත්වීම මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවරයි.

මෙවන් විපුල මෙහෙවරක නිරත සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමුපකාර ව්‍යාපාරය තුළ නියමු කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර, මෙම දෙපාර්තමේන්තුව පිළිබඳ පහසු අවබෝධයක් වාර්තාව පරිශීලනය කිරීම මඟින් ලබා ගැනීමේ හැකියාව ඇත.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි සියලු කාර්යයන් 2019 වර්ෂයේ දී සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය දැක් වූ සැමට මාගේ කෘතඥතාවය පළ කරන අතර, විවිධ අභියෝගයන් හා බාධක හමුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වර්ෂය තුළ දායකත්වය දැක් වූ ගරු අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතා හා පරිභෝගික සුබසාධන අමාත්‍යාංශ අමාත්‍යතුමා, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතා හා පරිභෝගික සුබසාධන අමාත්‍යාංශ ලේකම්තුමා, පළාත් කොමසාරිස්වරුන් හා මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට හා දිවයින පුරා විසිරී පවතින සියලුම සමුපකාර සමිති වෙත මාගේ ස්තූතිය පුද කරමි.

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ මෙන්ම ලෝක ප්‍රජාවගේ ද තිරසාර සංවර්ධන අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා ශක්තිය ධෛර්ය හා අවකාශයන් සියලුම සමුපකාරිකයන්ට ලැබෙවා යි ප්‍රාර්ථනා කරමි.

සුවින්ද එස්. සිංගප්පුලි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පටුන

*සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමන්ගේ පණිවුඩය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8 මූල්‍ය නොවන වෙනත් වත්කම් වාර්තාකිරීමේ කාර්ය සාධනය

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව 2019.12.31 දිනට ප්‍රගතිය

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

06 පරිච්ඡේදය

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2 මානව සම්පත් සංවර්ධනය

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ සමූපකාර ව්‍යාපාරය ආරම්භ වන්නේ 1906 වසරේ දී ණයදෙන සමිති ලෙසට ය. මේ වනවිට ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයට වසර 115ක් ද ඉක්ම ගොස් ඇත. වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය විවිධ ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ විහිද පැතිර පවතින අතර, ප්‍රජා ජන ජීවිතය සමග සමීපව කටයුතු කරන සමාජ සංවිධානයත් ලෙස ශක්තිමත්ව පවතී.

මෙරට සමූපකාර ව්‍යාපාරය නියාමනය හා මගපෙන්වීම සඳහා 1930 වසරේ දී ස්ථාපිත කරන ලද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මේ වනවිටත් විවිධ බාධක හමුවේ තම කටයුතු අඛණ්ඩව පවත්වගෙන යමින් සමුපකාර ව්‍යාපාරය ප්‍රචලිත කිරීම උදෙසා සමුපකාර සමිති වෙත වඩාත් සමීප සේවාවක් සපයනු ලබයි. 1972 අංක 5 දරණ සමූපකාර සමිති පනත සහ 1973 සමූපකාර සමිති රීති මාලාව මඟින් සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සමුපකාර ව්‍යාපාරය සංවර්ධනය මෙහෙයවීම හා මග පෙන්වීම වර්තමානයේ දී සමුපකාර සේවා අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02. යන ස්ථානයේ පිහිටි සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි.

වර්තමානයේ දී වඩාත් සුවිශේෂී සේවාවක් සැපයීම උදෙසා ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුගත වෙමින් එහි දැක්වෙන අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කැපවීමෙන් යුතුව කටයුතු කරන අතර, ඒ සඳහා නායකත්වය සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සුවින්ද එස්. සිංගප්පුලි මහතා විසින් මනා කැපවීමකින් යුතුව සපයනු ලබයි.

සමුපකාර සමිති පනත මගින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරුණු ව්‍යවස්ථාපිත කාර්යයන්ට අමතරව කාලීනව රටේ සංවර්ධනය සහ ප්‍රජා සුභසාධනය උදෙසා මැදිහත්විය යුතු සෑම අවස්ථාවකම මුලිකත්වය ගෙන පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ගනිමින් කටයුතු කිරීම දෙපාර්තමේන්තුව මගින් සෑම කල්හිම ඉටු කරනු ලබන සුවිශේෂී මෙහෙවරක් ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම රටතුළ මතු වන ඕනෑම අපාදා අවස්ථාවක දී සෘජුවම මැදිහත්ව පොදු ජනතාව වෙත සහන සැලසීම උදෙසා සමුපකාර සංවිධානය ඉතා විධිමත්ව මෙහෙයවීමට පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවලට ශක්තියක් වෙමින් කටයුතු කිරීම ද මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් අමතරව ගැනෙනු ඇත.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 යටතේ සකස් කරන ලද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 වාර්ෂික කාර්යසාධන වාර්තාව මෙමගින් ඉදිරිපත් කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

දැක්ම

ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය

මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය
ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා
සානුබල සපයමින්
සමුපකාර සමිතිවල යහ පාලනය
ගොඩ නැඟීම සඳහා
පුළුල් ලෙස මැදිහත් වීම.

1.3 ප්‍රධාන කාර්යන්

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

1. අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති සංගම් ලියාපදිංචි කිරීම
2. ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම්වල කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාළ කටයුතු සිදුකිරීම
3. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාරයේ කටයුතු මෙහෙයවීම
4. ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහයවීම
5. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම

අනෙකුත් කාර්යයන්

1. සමුපකාර සමිති ව්‍යවස්ථාපිත කටයුතු

i. සමිති ලියාපදිංචි කිරීම
ii. සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
iii. සාමාජිකත්වය පිළිබඳ කටයුතු
iv. අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
v. නිලවරණ කටයුතු අධීක්ෂණය
vi. මහ සභා කැඳවීම / කාරක සභා කැඳවීම හා වලංගුභාවය තීරණය කිරීම
vii. ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
viii. තීරකකරණ කටයුතු සහ උසාවි බල ගැන්වීම්
ix. සමුපකාර සමිති / සංගම්වල වාර්ෂික විගණනයන් සිදුකිරීම

2. කළමනාකරණ කටයුතු

i. පාලක මණ්ඩල පත් කිරීම / අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම
ii. ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය

iii. විගණනය
iv. පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය / විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
v. කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

3. සම්බන්ධීකරණ කටයුතු

i. සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ව්‍යවසායන් සමඟ සම්බන්ධීකරණය
ii. පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයට සහයවීම
iii. ජාත්‍යන්තර සමුපකාර සංධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
iv. සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
v. සමුපකාර සමිති වලට අදාළ සංඛ්‍යා ලේඛන පිළිබඳව මහ බැංකුව හා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
vi. අවශ්‍ය අවස්ථාවන්හි දී රජයේ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
vii. සමුපකාර සමිති / සංගම් අතර සම්බන්ධීකරණය

4. සංවර්ධන කටයුතු

i. වාර්ෂික අය වැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටු කිරීම
ii. සමුපකාර සමිතිවල යහ පාලනය සහතික කිරීමට අදාළ කටයුතු ඉටු කිරීම
iii. සමුපකාර සමිති හා සංගම්වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම
iv. සමුපකාර සමිති හා සංගම්වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය
v. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
vi. සංවර්ධන ආධාර හා සානුබල සැපයීම
vii. සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය
viii. සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය
ix. සේවක / නිලධාරී සුභසාධනය

5. අරමුදල් පාලනය

i. දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ සමුපකාර අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය
ii. ව්‍යවස්ථාපිත සමිතිවල වාර්ෂික විගණනයෙන් පසු වෙන් කරනු ලබන දායක මුදල් අය කර ගැනීම
iii. සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබාදීම
iv. ණය ආපසු අය කර ගැනීම
v. ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීම

6. අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු

i. සාමාන්‍ය පරිපාලනය
ii. මානව සම්පත් කළමනාකරණය
iii. කාර්ය සාධනය වර්ධනය
iv. වත්කම් කළමනාකරණය

1.4 සංවිධාන සටහන

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය



1.5 දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල කිසිවක් නොමැත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

සමුපකාර සංවර්ධන අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(i) සිට 44(iii) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඇවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණයහිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අය විය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

දෙපාර්තමේන්තුව යටතේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නොමැත.

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2019 වර්ෂයේ වැදගත් සිදුවීම්

මෙම දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ව්‍යුහයෙහි 2019 වසර තුල සිදු වූ සුවිශේෂී සිදුවීම් කිහිපයකි.

2019 වර්ෂයෙහි මැද භාගයේදී නව සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයකු වැඩ භාර ගන්නා ලදී. සහකාර කොමසාරිස් පුරප්පාඩු 02 සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය ලබා ගැනීම සිදු විය. පරිපූර්ණ හැකියාවන් සමුදායකින් යුතු එම නිලධාරීන් නියෝජ්‍ය කොමසාරිස් (පාලන) හා සහකාර කොමසාරිස් (පාලන) යන තනතුරු සඳහා පත්වීමත් සමඟම දෙපාර්තමේන්තුවෙහි රාජකාරී කටයුතු සිදු කරගෙනයාම වඩාත් පහසු විය. එසේම මෙම වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිත කර ඒ සඳහා අභ්‍යන්තර විගණකවරියක් නව පත්වීමක් ලෙස වැඩභාර ගන්නා ලදී.

එසේම පෞද්ගලික අංශය හා තරඟ කරමින් ඉදිරියට යන සමුපකාර ව්‍යාපාරය සඳහා මඟ පෙන්වීමට නව තාක්ෂණික දැනුම එක් කරමින් ගොඩනැඟූ තොරතුරු තාක්ෂණ අංශය සඳහා විශාල අඩුපාඩුවත්ව පැවති තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙකු පත්වීම් ලැබ දෙපාර්තමේන්තුව වෙත අනුයුත්කවීම මෙම වර්ෂය තුළ සිදු වූ තවත් සුවිශේෂීම සිදුවීමකි.

තවද රාජ්‍ය කළමණාකරන සහකාර III වන ශ්‍රේණියේ නව පත්වීම් ලබාගත් නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහායක III වන ශ්‍රේණියේ නව පත්වීම් ලැබූ නිලධාරීන් කිහිපදෙනෙකු සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා රාජකාරී ඉටු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ සේවයට 2019 වර්ෂය තුලදී එක් විය. එසේම සමුපකාර සංවර්ධන නිලධාරීන් සහ රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ නිලධාරීන් ද ස්ථාන මාරු වී යාමත් ස්ථාන මාරු වී පැමිණීමත් වරින් වර අවස්ථා කිහිපයකදී සිදු විය.

මීට අමතරව 97 වන ජාත්‍යන්තර සමුපකාර දින ජාතික උත්සවයේ දී සමුපකාර ව්‍යාපාරය සඳහා සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය එළිදැක්වීම සමුපකාර ව්‍යාපාරය වෙනුවෙන් ඉටු කරන ලද සුවිශේෂී මෙහෙවරක් ලෙස සඳහන් කළ හැකිය.

දෙපාර්තමේන්තුව මගින් සමස්ථ සමුපකාර ව්‍යාපාරයේ තොරතුරු ඇතුළත් කරමින් සකස් කරන ලද වාර්ෂික සංඛ්‍යාන වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාන ලේඛන දෙපාර්තමේන්තුවේ සහය ද ලබා ගනිමින් සකස් කිරීම හා දල දේශීය නිෂ්පාදනයට සමුපකාර අංශයේ දායකත්වය කොතෙක් ද යන්න හඳුනා ගැනීමට හැකි වන පරිදි සංඛ්‍යාන දත්ත සක්ස කිරීම සඳහා මූලාරම්භයක් ගැනීම සිදු විය.

නව පත්වීම්/ ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	නව පත්වීම/ ස්ථාන මාරු ලැබූ දිනය
01	එම්.ආර්. ඉමිතියාස් මයා	රියදුරු	2019.01.01
02	එස්.වී.ඩබ් දිසානායක මිය	සංවර්ධන නිලධාරී	2019.03.05
03	ජේ.ඒ.ජී.ඩී.එන්. ජයකොඩි මෙය	කළමනාකරණ සේවා නිලධාරී	2019.04.04
04	කේ. ධර්මලිංගම් මයා	භාෂා පරිවර්තක (ක්‍රොන්ත්‍රාන්)	2019.05.06
05	සුවින්ද එස්. සිංගප්පුලි මහතා	සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්	2019.06.11
06	ටී.එම්.ඊ.එච්. සරච්චන්ද්‍ර මිය	ගණකාධිකාරී	2019.07.01
07	කේ.ඒ.එච්. මාවින්ද මයා	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	2019.07.01
08	ඒ.ඒ.ටී.කේ.කේ. අමරසිංහ මෙය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	2019.07.01
09	එච්.ආර්.ඩී. බණ්ඩාර මයා	සංවර්ධන නිලධාරී	2019.07.04
10	ඩී.ඩී. රන්දෙණිය මයා	සංවර්ධන නිලධාරී (උපාධිධාරී පුහුණු)	2019.08.06
11	ආර්.ඩබ්.එස්.කේ. සමරසිංහ මයා	සංවර්ධන නිලධාරී (උපාධිධාරී පුහුණු)	2019.08.07
12	එම්.ටී. විජේකෝන් මෙය	සංවර්ධන නිලධාරී (උපාධිධාරී පුහුණු)	2019.08.07
13	එල්.ජී.එන්.ඩී. සෝමපාල මයා	සහකාර කොමසාරිස්	2019.09.02
14	ජී.ඒ.ජී.එස්.පී. ගනේආරච්චි මයා	සංවර්ධන නිලධාරී	2019.12.20

ස්ථාන මාරුවී ගිය/ මුදාහරින ලද සේවය අවසන් කරන ලද නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	ස්ථාන මාරු වී ගිය දිනය
01	එම්.ආර්. ඉමිතියාස් මයා	රියදුරු	2019.02.01
02	එස්.ඩී.එන්. ප්‍රනාන්දු මිය	සංවර්ධන නිලධාරී	2019.03.18
03	එච්.බී.එස්. පියුමිකා මෙය	කළමනාකරණ සේවා නිලධාරී	2019.04.04
04	පි.ජී.එස්. හේමචන්ද්‍ර මයා	කළමනාකරණ සේවා නිලධාරී	2019.05.02
05	පී.වයි.එන්. උදයංගනී මෙය	කළමනාකරණ සේවා නිලධාරී	2019.06.10
06	එස්.එල්. නසීර් මහතා	සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්	2019.06.11
07	එන්.ඒ.එන්. ජයතිලක මයා	කාර්යාල කාර්ය සහායක	2019.07.02
08	යූ.එල්.එන්. ධනංජලී මෙය	කළමනාකරණ සේවා නිලධාරී	2019.07.03
09	ආර්.ඒ.පි. හංසනී මෙය	කළමනාකරණ සේවා නිලධාරී	2019.08.01
10	කේ.ඩී.එස්.එස්.අබේරත්න මයා	කාර්යාල කාර්ය සහායක	2019.12.13

කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම

අනු අංකය	නම	තනතුර	විශ්‍රාම ගිය දිනය
01	පී.අයි. කුරේරා මිය	සමුපකාර සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය)	2019.04.07
02	එල්.එච්.සී.අයි.ද සිල්වා මිය	කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණිය	2019.08.14

පුහුණු හා මාධ්‍ය අංශය

දේශීය පුහුණු

2019 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල නිලධාරීන් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවා ඇත.

	පුහුණු වැඩසටහන	**සංවිධානය කළ ආයතනය**	**කාල සීමාව**	**සහභාගී වූ නිලධාරීන්**
01	ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීති භාවිතය	SDFL	2019.01.24/25	නලීන් රත්නායක මයා ධනුෂ විතාරණ මයා සුමුදු මීමනගේ මයා ශෂිනි පියුමිකා මෙය
02	සරප් මුදල් අයකැමි තනතුරේ කාර්ය භාරය	SDFL	2019.01.21	චිත්‍රා ද සිල්වා මිය නලීන් රත්නායක මයා
03	පුද්ගලික ලිපි ගොනුවක් පවත්වා ගෙන යාම	SDFL	2019.01.28/29	හෂානි දිල්රුක්ෂි මෙය අචිනි පිරිස් මෙය ඊ්.එම්. බටගම මිය බී.එම්.එස්.එන්. මධුෂාණි මෙය
04	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	SDFL	2019.02.07/08	ඕ.ටි. විතානාරච්චි මෙය බී.එල්.එන්. ක්‍රිෂාන්ති මෙය එච්.කේ.ඒ.එල්. මධුෂාණි මෙය
05	ප්‍රවාහන කළමනාකරණය	SDFL	2019.02.26/27	තාරංගි සෝමරත්න මිය
06	රාජ්‍ය ආයතන වල විගණන ප්‍රශ්න අවම කර ගන්නේ කෙසේද?	SDFL	2019.02.28 හා මාර්තු 01	චිත්‍රා ද සිල්වා මිය එච්.එස්. සම්පත් මයා බී.එම්.එම්. බන්දුල මයා ඉන්දික අධිකාරී මයා ලක්මාලී පිරිස් මිය
07	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	SDFL	සෙනසුරාදා දින 10ක්	ඕ.ටි.විතානාරච්චි මෙය එම්.අයි. සාරා මෙය
08	රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු විධිවිධාන	SDFL	2019.03.11/12	හෂානි දිල්රුක්ෂි මෙය
09	රාජ්‍ය ආයතන වල අවසාන ගිණුම් පිළියෙල කිරීම	SDFL	2019.03.14/15	කේ.ජී.එස්. උපමාලිකා මිය අචිනි පිරිස් මිය
10	රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයන් සඳහා විනය කාර්යාලීය ආචාර විධි	SDFL	2019.03.18/19	යූ.ජී. වාමර ලක්රුවන් මයා
11	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බිී ගිණුම	SDFL	2019.03.26	සනත් ද සිල්වා මයා නලීන් රත්නායක මයා
12	කාර්යක්ෂම කඩයිම් විභාගය (කාර්යාල කාර්ය සහායක)	ස.සං.දෙ	2019.06.17	සියළුම කාර්යාල කාර්ය සහායකයින්
13	විගණන පුහුණුව	මිලෝදා ආයතනය	2019.08.08/09	සරත් ආනන්ද මයා ලක්මාලී පිරිස් මිය පියුමි තමාලී මිය ඉන්දික අධිකාරී මයා ඒ.සී.බී ජයංගා මිය
14	කාර්යාල කාර්ය සහායක පුහුණුව	SDFL	2019.09.19/20	ඒ.එච්. අස්කින් මයා ආර්.එම්. රුක්ෂාන් මයා

විදේශීය පුහුණු

2019 වර්ෂය තුල දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල නිලධාරීන් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන, පුහුණු ශිෂ්‍යත්ව හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වී ඇත.

	නම	කාල පරිච්ඡේදය	පැවැත් වූ රට	වැඩසටහනේ නම
01	එස්.එන්.එස්. ජයසිංහ මිය	2019.03.11 - 2019.03.14	India	International Programme on "Women's Development through income generating Activities)
02	ඩබ්.ආර්.එම්. පෙරේරා මිය	2019.03.11 - 2019.03.14	India	International Programme on "Women's Development through income generating Activities)
03	එච්.එම්.ඒ.එස්. හේරත් මිය	2019.03.12 - 2019.03.15	India	Skill Development of Trainers in the area of Promotion and Financing of SHGS & JLGS for Financial Inclusion of Rural poor.
04	එල්.ඒ.එස්.එස්. ලියනාරච්චි මිය	2019.03.12 - 2019.03.15	India	Skill Development of Trainers in the area of Promotion and Financing of SHGS & JLGS for Financial Inclusion of Rural poor
05	එස්.එල්. නසීර් මයා	2019.03.06 - 2019.03.09	Bangkok	NEDAC new executive committee (ExCom)
06	ජේ.එම්.එන්.එම්. සෙනවිරත්න මිය	2019.06.10 - 2019.06.23	India	International Programme on Financing Small Enterprises for Rural Development
07	කේ.කේ.සී. හේරත් මිය	2019.06.10 - 2019.06.23	India	International Programme on Financing Small Enterprises for Rural Development
08	ජේ.එච්.එම්.එස්. බණ්ඩාරමැණිකේ මිය	2019.06.20 - 2019.06.23	China	2019 China Trade Conference Organized by WFP
09	සුවින්ද එස්. සිංගප්පුලි මයා	2019.07.22 - 2019.07.25	India	Family Farmers Cooperatives to End Hunger and Poverty through Integrated Farming in south Asia
10	චන්දන ෆොන්සේකා මයා	2019.09.12	India	CICTAB 50th Managing Committee Meeting
11	නිලංග ඩී. සෝමපාල මයා	2019.10.12 – 2019.10.13	India	NEDAC International Co-operative Trade Fair
12	සුවින්ද එස්.සිංගප්පුලි මයා		Kigali - Rwanda	Global Conference of International Cooperative Alliance
13	කේ.අයි. හසන් මයා	2019.11.18 - 2019.11.22	India	International Programme on "Digitalization and Financial Inclusion for CEOs and Senior Executives 18th – 22nd November"
14	එම්.ඒ.ඩී.අයි. මාරසිංහ මයා		Singapore	Annual Foreign Tour -2019

දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ වෙනත් පුහුණු වැඩසටහන්

	පැවැත් වූ දිනයන්	වැඩමුළුවේ නම	සහභාගී වූවන්
01	2019.08.29/30	නායකත්වය හා ආකල්ප සංවර්ධන වැඩසටහන	දෙපාර්තමේන්තු නිලධාරීන්
02	2019.12.27	ධනාත්මක චින්තන හා ආකල්ප වැඩසටහන	දෙපාර්තමේන්තු නිලධාරීන්
03	2019.1130 2019.12.02 හා 03	වරලත් ගණකාධිකරණ ආයතනය විසින් පවත්වනු ලබූ විගණන පුහුණුව	දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරීන්
04	2019.10.08	අධ්‍යක්ෂක මණ්ඩල දැනුවත් කිරීම් වැඩසටහන් 02ක් පැවැත්වීම	සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ ස.ණ.ස. සමිතිය සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු ස.ණ.ස සමිතිය

මාධ්‍ය කටයුතු

ශ්‍රී ලාංකීය සමුපකාර ව්‍යාපාරය ජනතාව අතර ව්‍යාප්ත කිරීමේ අරමුණු ඇතිව 2006 වර්ෂයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා සම්බන්ධව සමුපදීපනී නමින් පුවත්පත් අතිරේකයක් ආරම්භ කරන ලදී. මෙය මුල් කාලයේ සිංහල මාධ්‍යයෙන් පමණක් පළ වූ අතර, පසුව දෙමළ මාධ්‍යයෙන් ද පළ කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව සමුපදීපනී පුවත්පත සෑම මසකම අවසන් සිකුරාදා දින සිංහල මාධ්‍යයෙන් වර්ණ පිටු 08 කින් දිණමිණ පුවත්පත සමඟ හා දෙමළ මාධ්‍යයෙන් තිනකරන් පුවත්පතේ වර්ණ එක් පිටුවකින් පළ කිරීම සිදු කරනු ලබයි.

මෙරට මෙන්ම ජාත්‍යන්තර සමුපකාර ව්‍යාපාරය පිළිබඳව තොරතුරු ඇතුලත් කෙටි පුවත්, සමුපකාර ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතකුගේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳ අත්දැකීම් ඇතුලත් විශේෂාංග ලිපි, සමුපකාර සමිතියක් පිළිබඳ විස්තරාත්මක විශේෂාංග ලිපි, නිර්මාණ, ප්‍රහේලිකාව සහ ශ්‍රාස්ත්‍රීය ලිපි වලින් පුවත්පත නිර්මාණය වේ.

ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරය පිළිබඳව සහ Coop City සුපිරි වෙළඳසැල් ජාලය පිළිබඳ වාර්තා වැඩසටහන් දෙකක් නිර්මාණය කිරීම

සැලසුම්, සංවර්ධන, ප්‍රගති පාලන අංශය හා සමිති අංශය

සංවර්ධන ක්‍රියාකාරකම්

2019 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම

	සමිතිය/ සංගමය නම	**ලියාපදිංචි අංකය**	**ලියාපදිංචි කල දිනය**
01	සී/ස ශ්‍රී ලංකා ජාතික ජනෝදාන සංවර්ධන සමුපකාර මහා සංගමය	සමු 73	2019.04.04
02	සී/ස සමාධි වනිතා කෘෂි ව්‍යවසායික සංවර්ධන සමුපකාර සමිතිය	සමු 74	2019.06.03

2019 වර්ෂයේ සමුපකාර සමිති/ සංගම්වල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම හා කාලීනව සංශෝධන සඳහා උපදෙස් ලබාදීම

	සමිතියේ / සංගමයේ නම
01	සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය
02	සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය
03	සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
04	සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය
05	සී/ ස සමුපකාර දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරීන්ගේ ස ණ ස
06	සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ හා ණය ගනුදනු පිළිබඳ සමුපකාර සමිතිය
07	සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්යමණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය
08	සී/ස ශ්‍රී ලංකා වරාය නැවි සේවා සමුපකාර සමිතිය
09	සී/ස සමස්ත ලංකා මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය
10	සී/ස ශ්‍රී ලංකාව් කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය
11	සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම හා ණය දෙන සමිතිය

12	සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය
13	සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම්කම හා ණය ගනුදෙනු සමුපකාර සමිති මහා සංගමය
14	සී/ස සණසස සංවර්ධන බැංකුවේ සේවක සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය
15	සී/ස මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ගේ සකසුරුවම හා ණය ගනුදෙනු හා සුභසාධක සමුපකාර සමිතිය
16	සී/ස දුම්රිය මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය
17	සී/ස වරාය අධිකාරින්ගේ සේවක සුභසාධක සමුපකාර සමිතිය
18	සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය
19	සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය

2019 වර්ෂයේ සමුපකාර සමිති/ සංගම් නිලවරණ පැවැත්වීම

	සමිතියේ / සංගමයේ නම
01	සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම හා ණය දෙන සමිතිය
02	සී/ස සමස්ත ලංකා මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය
03	සී/ස ශ්‍රී ලංකා වරාය නැව් සේවා සමුපකාර සමිතිය
04	සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම්කම හා ණය ගනුදෙනු සමුපකාර සමිති මහා සංගමය
05	සී/ස මහජන බැංකු සේවක සණසස සමිතිය
06	සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු සණසස සමිතිය
07	සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය
08	සී/ස වරාය අධිකාරියේ සේවක බැංකු සමිතිය
09	සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය
10	සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැළැටි සහ උඩවැඩියා සමුපකාර සමිතිය
11	සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර මහ සංගමය

වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්

ජාතික මට්ටමේ සමුපකාර සංගම් 13ක් වර්ෂය තුළ ක්‍රියාකාරී තත්ත්වයේ පැවති අතර, දෙපාර්තමේන්තුව විසින් එකී සංගම් හි කළමනාකරණ හා ව්‍යාපාරික කටයුතු සඳහා මහපෙන්වමින් හා ඒ සඳහා සානුබල සපයමින් ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සෘජු අධීක්ෂණයක් ලබාදෙන ලදී.

	සංගමයේ නම	**ලියාපදිංචි අංකය**	**ලියාපදිංචි දිනය**
01	සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය	සී 1086	1942.04.01
02	සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය	සී 2490	1972.0726
03	සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය	සී 2504	1973.03.01
04	සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය	සී 2527	1974.03.19
05	සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති මහා සංගමය	සී 2651	1980.11.10
06	සී/ස ශ්‍රී ලංකා සමුපකාර ජේෂ කර්මාන්ත සංගමය	සී 2559	1981.09.02
07	සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය	සී 2689	1986.01.01

08	සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය	සමු 01	1989.09.15
09	සී/ස ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු මහා සංගමය	සමු 17	1997.12.15
10	සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදන සමුපකාර සංගමය	සමු 29	2003.10.07
11	සී/ස සකසුරුවම් හා ණය ගනුදෙනු සමිති සම්පත් කළමනාකරණ මහා සංගමය	සමු 30	2005.11.21
12	සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය	සමු 60	2018.08.08
13	සී/ස ශ්‍රී ලංකා ජාතික ජනෝදාන සංවර්ධන සමුපකාර මහා සංගමය	සමු 73	2019.04.04

වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති

දෙපාර්තමෙන්තුවේ අධීක්ෂණයට හා මෙහෙයවීමට යටත්ව දිප ව්‍යාප්ත සමුපකාර සමිති 61 ක් 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 03 කට වර්ග කර දැක්විය හැකිය.

- දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
- දිප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති
- පාසල් සමුපකාර සමිති

දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

බහුතරයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවකයින් සාමාජිකත්වය දරන සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති වේ.

මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්

1. සාමාජික ඉතුරුම් රාශීකරණය
2. සාමාජිකත්වයට ණය පහසුකම් සැපයීම
3. සාමාජික සුභසාධන කටයුතු (මරණාධාර, ශිෂ්‍යත්වාධාර, වෛද්‍යාධාර, පාරිභෝගික සේවා සැපයීම)
4. ව්‍යාපාරික කටයුතු (විශ්‍රාම ශාලා, නිවාඩු නිකේතන, උකස් සේවා, මුද්‍රණාල සේවා, රක්ෂණ නියෝජිත සේවා)

දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකාවම බල ප්‍රදේශය කර ගත් සාමාජිකයින්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයීමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති, දීපව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති ලෙස වර්ගීකරණය කර ඇත.

මෙම සමිතිවල මූලික කාර්යයන්

1. සාමාජිකයින්ගේ නිෂ්පාදන මිල දී ගැනීම.
2. නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා සාමාජිකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීම.
3. සාමාජිකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳුන්වාදීම සහ වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම.
4. සාමාජිකයින් සඳහා තාක්ෂණික මෙවලම් හා නවීන තාක්ෂණය හඳුන්වාදීම.

වර්ෂය තුළ ක්‍රියාත්මක වූ දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති හා දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

	සමිතියේ නම	**ලියාපදිංචි අංකය**	**ලියාපදිංචි කළ දිනය**
01	සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්‍යෝන්‍ය අර්ථසාධක අරමුදල් සමුපකාර සමිතිය	473	1928.03.15
02	සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමු.බැංකු සමිතිය	503	1928.12.07
03	සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සේවා සමූපකාර සමිතිය	සී.744	1930.11.30
04	සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු සේවක සඟස	සී.290	1938.03.30
05	සී/ස රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ සේවක සඟස	සී.255	1939.10.20
06	සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	සී.2233	1959.11.19
07	සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය	ඊ299	1960.05.26
08	සී/ස මහජන බැංකු සේවක සමූපකාර සමිතිය	සී.2266	1962.02.10
09	සී/ස රාජ්‍ය සේවා සමූපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය	සී. 326	1962.02.10
10	සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සඟස	සී 2280	1962.08.10
11	සී/ස සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සඟස	සී. 2357	1962.10.26
12	සී/ස සතොස සේවකයන්ගේ සමූපකාර සකසුරුවම් ඉතිරි කිරීම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය	සී 2294	1963.01.26
13	සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සඟස	සී 2283	1967.10.01
14	සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමූපකාර බැංකුව	සමු 02	1989.12.20
15	සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය	සමු 03	1990.03.07
16	සී/ස සමස්ත ලංකා මාදැල් හිමියන්ගේ ධීවර සමුපකාර සමිතිය	සමු 08	1992.01.29
17	සී/ස මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සුභසාධන සමුපකාර සමිතිය	සමු 10	1994.02.09
18	සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය	සමු 18	1998.04.06
19	සී/ස සඟස සංවර්ධන බැංකුවේ සේවක සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	සමු 22	2000.06.26
20	සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකාර්මික සහකාර නිලධාරීන්ගේ ස.ණ.ස. සමිතිය	සමු 25	2001.05.05
21	සී/ස ශ්‍රී ලංකා වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය	සමු 28	2003.07.11
22	සී/ස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතිය	සමු 31	2006.01.03
23	සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය	සමු 32	2006.11.29
24	සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය	සමු 34	2007.03.07
25	සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය	සමු 36	2011.07.07
26	සී/ස නිවාස හා දේපල සංවර්ධන සමුපකාර සමිතිය	සමු 39	2011.07.07
27	සී/ස රජරට විශ්ව විද්‍යාලයීය සමුපකාර සමිතිය	සමු 40	2011.08.24
27	සී/ස සමස්ථ ලංකා කෘෂිකාර්මික සමුපකාර සමිතිය	සමු 41	2012.01.05
28	සී/ස ප්‍රජාශක්ති තරුණ අභිවෘද්ධි සමුපකාර සමිතිය	සමු 43	2014.08.06
29	සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ගේ ඉතිරිකිරීමේ හා සංවර්ධන සේවා සමුපකාර සමිතිය	සමු 44	2014.08.12
30	සී/ස කෘෂිකාර්මික හා පාරිසරික විද්වතුන්ගේ සංවර්ධන සමුපකාර සමිතිය	සමු 46	2016.02.08

31	සී/ස ශ්‍රී ලංකා ව්‍යවසාය සංවර්ධන සමුපකාර සමිතිය	සමු 47	2016.02.08
32	සී/ස ශ්‍රී ලංකාවේ තාක්ෂණ සංවර්ධන ජාතික සමුපකාර සමිතිය	සමු 48	2016.07.02
33	සී/ස ජාතික වාණිජ සමුපකාර සමිතිය	සමු 50	2016.07.02
34	සී/ස ශ්‍රී ලංකා සංවර්ධන හා ආයෝජන සමුපකාර සමිතිය	සමු 49	2016.07.02
35	සී/ස සමස්ථ ලංකා මල් හා විසිතුරු පැළ වගාකරුවන්ගේ සමුපකාර සමිතිය	සමු 52	2017.05.31
36	සී/ස විගණන හා කළමණාකරණ සේවා සැපයීමේ සමුපකාර සමිතිය	සමු 53	2017.08.24
37	සී/ස ශ්‍රී ලංකාවේ හරිත සමුපකාර සමිතිය	සමු 54	2017.10.16
38	සී/ස ජාතික පරිසරය සුරකින්නන්ගේ සමුපකාර සමිතිය	සමු 55	2017.10.16
39	සී/ස ව්‍යාපාර කළමණාකරණ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන හා තාක්ෂණික සේවා උපදේශන සමුපකාර සමිතිය	සමු 56	2017.12.29
40	සී/ස ජාතික විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ සමුපකාර සමිතිය	සමු 57	2018.02.21
41	සී/ස ජනමාධ්‍යවේදීන්ගේ සමුපකාර සමිතිය	සමු 58	2018.02.22
42	සී/ස ශ්‍රී ලංකා අත් යන්ත්‍ර නිෂ්පාදකවරුන්ගේ අලෙවි කිරීම් හා ව්‍යවසායකයින්ගේ සමූපකාර සමිතිය	සමු 59	2018.05.23
43	සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සණස	473	1975.12.05
44	සී/ස දුම්රිය ස්ථානාධිපති හා ලිපිකරු සණස	සී.1649	
45	සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සමිතිය	සී.736	1930.11.01
46	සී/ස ජාතික පුහුණු වෘත්තියවේදීන්ගේ සමූපකාර සමිතිය	සමු.51	2016.09.28
47	සී/ස සමස්ත ලංකා විදේශ භාෂා අධ්‍යාපන ප්‍රවර්ධන සමූපකාර සමිතිය	සමු 61	2018.09.11
48	සී/ස තාරුණ්‍ය සවිබල ගැන්වීමේ සමු.සමිතිය	සමු 63	2018.10.05
49	සී/ස හදබිම සමුපකාර සමිතිය	පා. සමු 64	2018.10.05
50	සී/ස අල් අක්ෂා ජාතික පාසල් සමුපකාර සමිතිය	පා. සමු 65	2018.12.05
51	සී/ස කන්නන්ගර ශක්ති පාසල් සමුපකාර සමිතිය	පා. සමු 66	2018.12.05
52	සී/ස හොරණ රාජකීය විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය	පා. සමු 67	2018.12.12
53	සී/ස ආනන්ද නැණ උදාන පාසල් සමුපකාර සමිතිය	පා. සමු 68	2018.12.12
54	සී/ස ජයන්ති පාසල් සමුපකාර සමිතිය	පා. සමු 69	2018.12.19
55	සී/ස බප/වේ/වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලයීය පාසල් සමූපකාර සමිතිය	පා. සමු 70	2018.12.19
56	සී/ස පොර/මින්නේරිය ජාතික පාසල් සමුපකාර සමිතිය	පා. සමු 71	2018.12.20
57	සී/ස වවිනියා මුස්ලිම් මහා විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය	පා.සමු 72	2018.12.20
58	සී/ස සමාධි වනිතා කෘෂි ව්‍යවසායික සංවර්ධන සමුපකාර සමිතිය	සමු 74	2019.06.03

විගණන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ විගණන අංශය විසින් ව්‍යවස්ථාපිත විගණන කටයුතු යටතේ 2015 සිට 2019 දක්වා සැලසුම් කරන ලද හා කාර්යාලය වෙත ලද විගණන වාර්තා පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

විගණන වර්ෂය	සැලසුම් කළ විගණන	නිම කළ විගණන	වර්ෂය තුළ නිම කළ විගණනයන්හි ප්‍රතිශතය
2014	68	44	64.7%
2015	80	11	13.75%
2016	102	37	36.27%
2017	58	43	74.13%
2018	108	56	60.48%
2019	47	31	65.95%

වසර 6ක සැලසුම් කළ විගණන හා නිම කළ විගණන



නීති අංශය

නීති කටයුතු වලට අදාල ප්‍රධාන කාර්යයන් පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකි ය.

1. සමුපකාර සමිතිවලට සම්බන්ධ නිතිරීති හා ව්‍යවස්ථා සම්බන්ධයෙන් අර්ථකතනයන් ඉදිරිපත් කිරීම හා පළාත් කොමසාරිස්වරුන් ඉදිරිපත් කරන නෛතික ගැටළු පිළිබඳ අවශ්‍ය සහය ලබාදීම
2. ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම හා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා අධ්‍යයනය කිරීම
3. සමුපකාර පනතේ 58 වගන්තිය යටතේ සමුපකාර සමිති/ සංගම් වලින් ඉදිරිපත් කරන තීරක ආරවුල් විභාග කිරීම, ප්‍රදානයන් ලබාදීම,අභියාචනා විභාග කිරීම හා උසාවි බල ගැන්වීම

4. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්, වග උත්තරකරුවන් කරමින් දිස්ත්‍රික් උසාවි, අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ වලින් ඉදිරිපත් කරන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම

ආරවුල් බේරුම්කරණය

විස්තරය	**එකතුව**
2019/01/01 දිනට බේරුම්කරුවන් වෙත යොමු කිරීමට පවතින ගොනු සංඛ්‍යාව	72
2019 වර්ෂයේ බේරුම්කරණය සඳහා කාලය තුළ ලද ගොනු සංඛ්‍යාව	47
එකතුව	**119**
2019 වර්ෂයේ බේරුම්කරණය සඳහා යොමු කිරීම (බේරුම්කරුවන් වෙත ලබා දීම)	55
2019 වර්ෂය තුළ ආපසු යැවූ ගොනු සංඛ්‍යාව	20
2019-12-31 දිනට බේරුම්කරණය සඳහා යොමු කිරීමට ඇති සංඛ්‍යාව	44
එකතුව	**63**

උසාවි දඩ මුදල් ප්‍රේෂණය

1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය යටතේ සමුපකාර සමිති විසින් බේරුම්කරණය සඳහා යොමු කරනු ලබන ආරවුල් සඳහා තීරක තීන්දු ලබාදීමෙන් පසු අදාළ මුදල් අය නොවන්නේ නම් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් එම මුදල දඩ මුදලක් සේ අය කර ගැනීමට අදාළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි බලගන්වන අතර එසේ අධිකරණයෙන් අය වන මුදල් නැවත අදාළ සමුපකාර සමිති වෙත ප්‍රේෂණය කරනු ලැබේ.

1. බේරුම්කරණ තීන්දු උසාවි බල ගැන්වීම් - 200
2. අධිකරණයෙන් දෙපාර්තමේන්තුව වෙත මුදල් ලබා ගැනීම් - රු. 16,530,208.92
3. අධිකරණයෙන් ලද මුදල සමිතිය වෙත මුදා හැරීම් - රු. 14,348,679.99

සුවිශේෂී කරුණු

1. 1983 අංක 32 හා 92 අංක 11 දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත කාලීන අවශ්‍යතාවයන්ට / වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම සඳහා යෝජනා ලබා ගැනීමට විද්වත් කමිටුවක් අමාත්‍ය මණ්ඩල මගින් පත් කිරීම.
2. සමුපකාර මූල්‍ය ආයතන නියාමනය සඳහා පනත් කෙටුම්පත් සකස් කිරීම

නීති අංශය මඟින් සිදු කරන ලද අනෙකුත් විශේෂිත කාර්යන්

- ජාතික සමුපකාර ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- සමුපකාර අතුරු ව්‍යවස්ථා සංශෝධනය සඳහා නිර්දේශ ලබා ගැනීම
- සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය සඳහා නිර්දේශ ලබා ගැනීම
- සමුපකාර සමිති සඳහා අවශ්‍ය නෛතික උපදෙස් ලබා දීම

අරමුදල් අංශය

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43(1) (ආ) වගන්තිය සහ 57(3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදී ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර, එම අරමුදලේ දායක මුදල් අය කර ගැනීම මෙන්ම වියදම් දැරීම, ආයෝජන, ණය හා ආධාර සැපයීම යන කාර්යයන් ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් අරමුදල් කමිටුවේ තීරණ අනුව කළමනාකරණය කරනු ලැබේ.

1. සමුපකාර සංවර්ධන අරමුදල
2. සමුපකාර අතිරික්ත අරමුදල

සමුපකාර සංවර්ධන අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(i) සිට 44(iii) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඇවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණයහිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අය විය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

බැංකු අංශය

2013 වර්ෂයේ මැයි මස ස්ථාපිත කරන ලද මෙම අංශය මඟින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) යටතේ ලියාපදිංචි මූල්‍ය කටයුතුවල නිරත සමුපකාර සමිති/සංගම් නියාමනය ද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු යටතේ ලියාපදිංචි මූල්‍ය කටයුතුවල නිරත සමුපකාර සමිති/සංගම් නියාමනය සඳහා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සමඟ සහයෝගීතාවයෙන් එම පළාත්වල මූල්‍ය කටයුතුවල නිරත සමුපකාර සමිති/සංගම් නියාමනයට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීම ද සිදු වේ.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිතිවල මූල්‍ය කටයුතු ශක්තිමක් කිරීම සඳහා මූල්‍ය නියාමන අංශය මඟින් 2019 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන් පහත දක්වා අත.

ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිතිවල මූල්‍ය කටයුතු අධීක්ෂණය

- රේඛීය හා පළාත් ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිතිවල මූල්‍ය අංශ සමාලෝචනය
- කාර්තුවකට අදාල ග්‍රාමීය බැංකු ත්‍රෛමාසික වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම
- රේඛීය දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සමිති/සංගම් හි ස්ථානීය පරීක්ෂණ සිදු කිරීම

- රේඛීය පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු මඟින් නියාමනය වන ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිති වල මූල්‍ය තත්ත්ව වාර්තා විශ්ලේෂණය කිරීම, මූල්‍ය අවදානම් සහිත ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිති පිළිබඳ දැනුවත් කිරීම් සිදුකිරීම

ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිතිවල මූල්‍ය කටයුතු නියාමනය සහ සංවර්ධනය

- රජයේ වරින් වරට ගනු ලබන සමුපකාර මූල්‍ය ක්ෂේත්‍රයට අදාල ප්‍රතිපත්තිමය තීන්දු පිළිබඳ රේඛීය/ පළාත් දෙපාර්තමේන්තු මඟින් ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිති පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම
- ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිති නියාමනයට අදාල චක්‍රලේඛ, උපදෙස් නිකුත් කිරීම
- ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිති නියාමනය සඳහා පනතක් කෙටුම්පත් කිරීම
- සඟස සමිතිවලට අදාල අභ්‍යන්තර විගණන අත්පොත් කෙටුම්පත් කිරීම
- ගිණුම්කරණ අත්පොත කෙටුම්පත් කිරීම
- පළාත් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ රැස්වීම් 02ක් පවත්වා මූල්‍ය නියාමනයට අදාල තොරතුරු පිළිබඳ රේඛීය හා පළාත් දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම
- ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති නියාමන ජාතික කමිටු රැස්වීම් 01ක් පවත්වා වර්තමාන සමුපකාර මූල්‍ය ක්ෂේත්‍රයේ සිදු කළ යුතු වෙනස්කම්, තාක්ෂණික කමිටු නිර්දේශ, මූල්‍ය නියාමන පනත කෙටුම්පත් කිරීම පිළිබඳ තීරණ ගැනීම
- සමුපකාර මූල්‍ය ක්ෂේත්‍රයෙහි සාමාජිකත්වය දරන හා සාමාජික නොවන තැම්පතුකරුවන් දැනුවත් කිරීම,ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති දැනුවත් කිරීම අරමුණ කර අවස්ථානෝචිතව පුවත්පත් දැන්වීම් පළ කිරීම
- ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති සම්බන්ධව පළාත් මට්ටමෙන් යොමු වන පෙත්සම් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා අදාල පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙත යොමු කිරීම
- රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වන ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති සම්බන්ධව යොමු වන පෙත්සම් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා නීති අංශය වෙත යොමු කිරීම

පළාත් දෙපාර්තමේන්තු විෂය පථයන්ට අදාලව ලැබෙන පැමිණිලි හා පෙත්සම් අදාල පළාත්වලට යොමු කිරීම පහත පරිදි වේ.

	පළාත	යොමු කළ පැමිණිලි සංඛ්‍යාව
01	බස්නාහිර පළාත	60
02	දකුණු පළාත	23
03	මධ්‍යම පළාත	14
04	වයඹ පළාත	19
05	උතුරු මැද පළාත	12

	පළාත	යොමු කළ පැමිණිලි සංඛ්‍යාව
06	නැගෙනහිර පළාත	10
07	සබරගමුව පළාත	05
08	ඌව පළාත	06
09	උතුරු පළාත	05

ව්‍යාපෘති අංශය

මෙම අංශය මඟින් පහත සඳහන් ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී.

❖ නැණ ශක්ති පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන

“ නැණ ශක්ති ”පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහනෙහි මූලික අරමුණ ලෙසින් ජාතික මට්ටමේ පාසල් සමුපකාර සමිති පිහිටුවීම සඳහා 2017 වසර තුළ දී කටයුතු සංවිධානය කෙරුණු අතර 2019 වසරේදී එය වඩාත් සාර්ථකව සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි. එහිදී මෙම වසර තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදී වේ.

අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටින පාසල් සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ පවත්වන ලෙසට පළාත් කොමසාරිස්වරුන්ගේ ඉල්ලීම් කරන ලද අතර, ජාතික පාසල් සහ දුෂ්කර පාසල් පිළිබඳව පළාත්වලින් තොරතුරු ලබා ගෙන මෙම සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලදී. ඒ අනුව සංවිධාන කටයුතු පළාත් 08ක් තුළ සම්මන්ත්‍රණ 27ක් සාර්ථකව පැවැත්වීමට හැකියාව ලැබුණි.

	පළාත	පාසලේ නම	සම්මන්ත්‍රණ ගණන
01	උතුර	ව/ ගාමිණී මහා විද්‍යාලය	04
02		මන්/ සිතිවිනායහර් හින්දු විද්‍යාලය	
03		මු/ උඩයාර්කට්ටු මහා විද්‍යාලය	
04		යා/ යුනියන් විද්‍යාලය	
05	උතුරු මැද	පො/ ගිරිතලේ මධ්‍ය විද්‍යාලය	03
06		පො/ මින්නේරිය ජාතික පාසල	
07		අනු/ රුවන්වැලි මධ්‍ය විද්‍යාලය	
08	ඌව	බ/ඩී.එස්. සේනානායක ජාතික පාසල	04
09		බ/මහියංගන ජාතික පාසල	
10	වයඹ	ඉංගරදවුල මහා විද්‍යාලය	03
11		වැවගම මහා විද්‍යාලය	
12		නික/ ජයන්ති මධ්‍ය මහා විද්‍යලය	
13	සබරගමුව	ර/ ඇෑපොළ මහින්ද මහා විද්‍යාලය	05
14		ර/නිවි/ කරවිට මහා විද්‍යාලය	
15		ර/ ඕපනායක විද්‍යාකර මහා විද්‍යාලය	
16		කෑ/ මව/ ගනේතැන්ත මහා විද්‍යාලය	
17		ර/ ගැටහැත්ත අනුර මහා විද්‍යාලය	
18	දකුණු	ගා/ නෙළුව ජාතික පාසල	03
19		මාර/ මොරවක කිර්ති අබේවික්‍රම ජාතික පාසල	
20		හ/ හුංගම විජයබා ජාතික පාසල	
21	නැගෙනහිර	මඩ/ කන්නන්කුඩා මහා විද්‍යාලය	04
22		අම්/ දෙහිඅත්තකණ්ඩිය මධ්‍ය මහා විද්‍යාලය	
23		කල්/ සමන්තුරෙයි ජාතික පාසල	
24		මු/ මධ්‍ය විද්‍යාලය	
25	මධ්‍යම	මප/නෙල්/සරත් ඒකනායක ප්‍රාථමික විද්‍යාලය	01

❖ පාසල් තුළ COOP SHOP පිහිටුවීම

පාසල් සිසුන් සමුපකාර ව්‍යාපාරයට නැඹුරු කරවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන නැණ ශක්ති පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන යටතේ පාසල් සිසුන් සඳහා සහන මිලට පාසල් උපකරණ ලබා දීම සහ පාසල් සමුපකාර සමිතිවලට ආදායමක් ලබා ගැනීමට මෙම දෙපාර්තමේනතුව යටතේ සහ පළාත් දෙපාර්තමේන්තුව යටතේ සහ පළාත් දෙපාර්තමේන්තුව යටතේ ඇති පහත සඳහන් පාසල් සමුපකාර සමිති COOP SHOP ආරම්භ කිරීමට ඡායා පිටපත් යන්ත්‍ර, ගොන්ඩෝලා රාක්ක හා කබඩ් ආදිය මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර වශයෙන් රු. 500,000/= ක් බැගින් ලබා දෙන ලදී.

රේඛීය දෙපාර්තමේන්තුව යටතේ ඇති සමිති	
01	සී/ස මින්නේරිය ජාතික පාසල් සමුපකාර සමිතිය
02	සී/ස නිකවැරටිය ජයන්ති ජාතික පාසල් සමුපකාර සමිතිය
03	සී/ස ආනමඩුව කන්නන්ගර ශක්ති පාසල් සමුපකාර සමිතිය
04	සී/ස වවුනියාව මුස්ලිම් මහා විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය
05	සී/ස වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විදුහල් පාසල් සමුපකාර සමිතිය
06	සී/ස හොරණ රාජකීය පාසල් සමුපකාර සමිතිය
07	සී/ස පුත්තලම ආනන්ද නැණ උදාන පාසල් සමුපකාර සමිතිය
08	සී/ස රජරට විශ්ව විද්‍යාලීය විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය

නැගෙනහිර පළාත් දෙපාර්තමේන්තුව යටතේ ඇති සමිති	
01	මඩ/ වින්සන්ට් උසස් බාලිකා විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය
02	ත්‍රී/ මු/ අල් හිතාය මහා විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය
03	අම්/ දෙ/ දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල් සමුපකාර සමිතිය
04	ක/මහමුද් කාන්තා බාලිකා විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය
වයඹ පළාත් දෙපාර්තමේන්තුව යටතේ ඇති සමිති	
01	පරගහදෙණිය ජාතික පාසල් සමුපකාර සමිතිය
උතුරු පළාත් දෙපාර්තමේන්තුව යටතේ ඇති සමිති	
01	කල්/ අල් ආක්ෂා ජාතික පාසල් සමුපකාර සමිතිය

❖ සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමයේ සිදුකරන ලද සංවර්ධන කටයුතු

දහර කඹ නිෂ්පාදන අංශයේ වහල අළුත්වැඩියා කිරීම, ඩිකෝට්කේටඩ් වර්ගයේ කොහු නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර ලබා දීම මඟින් උසස් ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන වෙළඳපල වෙත යොමු කර සංගමය ලාභදායී මට්ටමකට ගෙන ඒම සඳහා දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දෙන ලදී.

දේශීය අමුද්‍රව්‍ය ආශ්‍රිතව කොහු නිෂ්පාදනය සඳහා ඩිකෝට්කේටඩ් වර්ගයේ කොහු නිෂ්පාදන යන්ත්‍රය සවි කිරීමට රු. 1,692,427.00ක ද මුදලක් ද අබලන් තත්ත්වයේ පැවති දහර කඹ නිෂ්පාදන අංශයේ වහල අළුත්වැඩියා කිරීම සඳහා රු. 1,500,000.00ක මුදලක් ද ලබා දෙන ලදී.

❖ කෝප් සිටි 100ක් සංවර්ධනය කිරීම

විවෘත ආර්ථිකය මෙරටට පැමිණීමත් සමගම, විවිධ ආර්ථික විචල්‍යතා වලට මුහුණ දෙමින් සමුපකාර ව්‍යාපාරයේ පාරිභෝගික අංශයේද පවතින වෙළඳපල රටාවට අනුගත වීමට තම ශක්ති ප්‍රමාණයෙන් කටයුතු කර ඇත.

එහිදී ශ්‍රී ලංකාව තුළ පැතිර පවතින සුපිරිවෙළඳ සැල් ජාලය පසුගිය වසර 2ක පමණ කාලයක සිට නවීන වෙනස්කම් රාශියකට බදුන් වීම නිරීක්ෂණය කරමින් සමුපකාර සුපිරි වෙළඳසැල් ජාලය ද එයට අනුගත විය යුතු බවට අප විසින් හඳුනා ගන්නා ලදී.

පළාත් සභා විෂයක් ලෙස සමුපකාර විෂය පැවැතුනද පළාත් එකඟතා මත සමස්ත සමුපකාර වෙළඳසැල් ජාලය සංවර්ධනය කළ යුතුය යන ස්ථාවරය මත අප විසින් එකී කාර්යය ඉටුකිරීම හා පවත්වාගෙන යාම සඳහා එයටම සුවිශේෂී වූ ප්‍රවීණයන් පිරිසකගේ සාමාජිකත්වයෙන් සී/ස ව්‍යාපාර කළමනාකරණ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන සහ තාක්ෂණික සේවා උපදේශන සමුපකාර සමිතිය නමින් සමු 56 අංකය යටතේ සමුපකාර සමිතියක් බිහි කරන ලදී.

එම සමිතිය මඟින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම්ද ඒකරාශිකර ගනිමින් සමුපකාර සුපිරි වෙළඳසැල් ජාලය නව මුහුණුවරකින් පාරිභෝගික ජනතාව වෙත රැගෙන ඒමට මේ වන විට කටයුතු කර ඇත.

ඒ අනුව 2019 වර්ෂය තුළ නවීකරණය කරන ලද සමුපකාර සුපිරි වෙළඳසැල් සංඛ්‍යාව 36කි.

සමුපකාර සුපිරි වෙළඳසැල් ජාලයට සුවිශේෂී වූ කරුණු කිහිපයක් පහතින් දැක්වේ.

- ජාත්‍යන්තරව සමුපකාර ව්‍යාපාරයටම හිමි වූ සන්නාමයක් භාවිතා කිරීම
- හරිත සංකල්පය තුළ සියළු සැලසුම් සකස් කිරීම
- සේවකයින් ඇතුළු කාර්ය මණ්ඩල වල සේවාවන් සංවර්ධනය කිරීම
- භාණ්ඩ, ඇසුරුම් ක්‍රම විද්‍යානුකූල ක්‍රමවේදයන් මත සිදු කිරීම

❖ 97 වන ජාත්‍යන්තර සමුපකාර දින උත්සවය

97 වන ජාත්‍යන්තර සමුපකාර දිනය 2019 වසරේදී ශ්‍රී ලංකාව පුරා සමුපකාරිකයන් ඉතා උනන්දුවෙන් හා උද්යෝගයෙන් සැමරුහ. විවිධාකාරයෙන් සමුපකාරිකයන් ඇගයීම 2019 වසර තුළදී සමුපකාර දිනයට සමගාමීව සිදු කරන ලදී. මේ සියල්ල අගයමින් 97 වන සමුපකාර දින සැමරුම් උළෙල මාතර සනත් ජයසූරිය ක්‍රීඩාංගනයේදී ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්කර්ශවත් ලෙස පවත් වන ලදී. උත්සවයේ සියළු සංවිධාන කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

❖ V Enterprise Sri Lanka වෙළඳ ප්‍රදර්ශනය පැවැත්වීම

එන්ට්‍රප්‍රයිස් ශ්‍රී ලංකා විෂන් 2025 ප්‍රදර්ශනය මෙම වසරේ ප්‍රදර්ශන 02ක් පවත්වන ලදී. අගොස්තු මස 23 දින සිට 27 දක්වා අනුරාධපුරයේදී ද සැප්තැම්බර් මස 07 දින සිට 10 දක්වා යාපනය නගරයන් කේන්ද්‍ර කර ගෙන ප්‍රදර්ශනයන් ආරම්භ විය. එහි සියළුම අමාත්‍යාංශ වල ප්‍රදර්ශන කුටි වෙන් කර තිබූ අතර, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ මෙම දෙපාර්තමේන්තුව මඟින් කුටියක් සකස් කර තිබුණි. එහිදී පාසල් ළමුන් ඇතුළු විශාල පිරිසක් සමුපකාර විෂය පිළිබඳ දැනුම ලබා ගැනීම පිණිස ප්‍රදර්ශන කුටිය වෙත පැමිණෙන ලදී.

තොරතුරු තාක්ෂණ අංශය

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ක්‍රියාත්මක රාජ්‍ය ව්‍යවසායන් සහ පෞද්ගලික ව්‍යවසායන් සමඟ තරඟ කරන දැවැන්ත ව්‍යවසායක් ලෙස සමුපකාර ව්‍යාපාරය සියවසකට ආසන්න කාළයක් තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. නමුත් වර්තමාන සමුපකාර ව්‍යාපාරයේ ආර්ථික හා ආර්ථික නොවන තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා ගැනීමේ අපහසුව නිසාම රටේ ආර්ථික තීරණ ගැනීමේදී ද සමුපකාර ව්‍යාපාරය මඟහැරී ගොස් ඇත.

මෙම අඩුපාඩුව හදුනාගත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ස්වයංක්‍රීය කළමනාකරණ තොරතුරු පද්ධතියක් යටතේ සිදු කිරීමටත් පසුව සමුපකාර ව්‍යාපාරය මෙම තොරතුරු පද්ධතිය මගින් සම්බන්ධ කර ගැනීම මගින් මෙම අඩුපාඩු මඟහරවා ගනිමින් ඵලදායී කාර්යක්ෂම සමුපකාර ව්‍යාපාරයක් ස්ථාපනය කිරීමේ අරමුණ සහිතව 2017 වර්ෂයේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ තොරතුරු තාක්ෂණ ඒකකයක් ස්ථාපනය කරගන්නා ලදී. එම ඒකකය වඩාත් ශක්තිමත් වෙමින් මෙම වසර තුළ සුවිශාල කාර්ය භාරයක් ඉටු කර ඇත.

- කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ ව්‍යාපෘතියේ (Info-Coop ව්‍යාපෘතිය) කටයුතු කිරීම
  - I. Info-Coop ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු (Project Steering Committee – PSC) රැස්වීම් සංවිධානය කිරීම හා එම රැස්වීම්වලදී සාකච්ඡා කළ කරුණු ක්‍රියාත්මක කිරීම
  - II. Info-Coop ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම
  - III. Info-Coop ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටු (Technical Evaluation Committee – TEC) රැස්වීම් සංවිධානය කිරීම හා එම රැස්වීම් වලදී සාකච්ඡා කළ කරුණු ක්‍රියාත්මක කිරීම
  - IV. Info-Coop ව්‍යාපෘතියේ උපදේශන ආයතනය වන කැළණිය විශ්ව විද්‍යාලය සමඟ සම්බන්ධ වී Request for Proposal (RFP) සෑදීම
  - V. තාක්ෂණික ඇගයීම් කමිටුව සමඟ සම්බන්ද වී Bidding Documents
    - ✓ Request for proposal (REP)
    - ✓ Expression of Interest (EOI)
    - ✓ EOI Information Form
    - ✓ EOI Evaluation Criteria
    - ✓ Procurement Plan
    - ✓ Procurement Action Plan
  - VI. කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම හා සමුපකාර සංවර්ධන සහ වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය හරහා Info-Coop ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු කිරීමට අනුමැතිය ලබා ගැනීම
  - VII. Info-Coop ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු සාමාජිකයින් සඳහා ගෙවීම් අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යැවීම
  - VIII. ප්‍රසම්පාදන ආකෘතිය සැලසුම් කිරීම සහ අවසන් කිරීම
  - IX. Info-Coop ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය අනුමත කර ගැනීම සඳහා අයවැය දෙපාර්තමේන්තුවට ලිපි යැවීම
- දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (Website) හා සමාජ මාධ්‍ය (Social Media) යාවත්කාලීන කිරීම හා කළමනාකරණය කිරීම
  - I. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ News, Gallery, Banner & Contents යාවත්කාලීන කිරීම
  - II. Web Server හා කළමනාකරණය කිරීම
  - III. දෙපාර්තමේන්තුවේ නිල Facebook ගිණුම කළමනාකරණය කිරීම

- LGN අන්තර්ජාල පහසුකම දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ට ලබා දීමේ කටයුතු කළමනාකරණය කිරීම
- Internal Memo Management Software System නිර්මාණය කිරීම
- Designing Artwork කිරීම
  I. 97 වන ජාත්‍යන්තර සමුපකාර දින සැමරුම් උත්සවයේ සියලු Designing Artwork කිරීම
  II. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත Designing Artwork කිරීම
- දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ට Official E Mails සකසා දීම

03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-ඒෆ්

අයවැය 2019		සටහන	තත්‍ය 2019	2018	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2		-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		208,725,150	1,829,283,240	ඒසීඒ-3
-	තැන්පතු		138,476	49,797	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		5,001,831	5,557,880	ඒසීඒ-5/5(ඒ)/5 (බී)
-	වෙනත් ලැබීම්		6,224,141	2,799,937	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**220,089,598**	**1,837,690,854**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**220,089,598**	**1,837,690,854**	
	අඩුකළා : වියදම්				
76,300,000	**පුනරාවර්තන වියදම්**		-	-	
58,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	57,965,327	53,876,203	
16,676,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	16,575,416	15,557,782	ඒසීඒ-2(ii)
1,124,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,117,076	1,076,970	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
76,300,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**75,657,819**	**70,510,955**	
34,000,000	**මූලධන වියදම්**				
900,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	828,655	589,809	
1,200,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,014,769	311,318	
31,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	21,070,921	13,455,767	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
400,000	හැකියා වර්ධනය	14	397,035	525,884	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
34,000,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**23,311,380**	**14,882,778**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**5,724,902**	**6,475,071**	
	තැන්පතු ගෙවීම්		**134,620**	**165,057**	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		**5,590,282**	**6,310,014**	ඒසීඒ-5/5(ඒ)/5(බී)
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		**104,694,101**	**91,868,804**	
-	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**115,395,497**	**1,745,822,050**	

3.2 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කත්‍ය	
		2019	**2018**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසිඒ-6	54,329,799.00	19,230,710.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	16,147,573.00	15,559,122.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**70,477,372.00**	**34,789,832.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		13,182,668.00	12,588,816.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය		54,329,799.00	19,230,710.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5 (බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	2,907,500.00	2,970,306.00
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	57,405.00	-
මුළු වගකීම්		**70,477,372.00**	**34,789,832.00**

පිටු අංක...01.....සිට ...46..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...01..... සිට ...53..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදි මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙලිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා,ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ජී.කේ.එස්.එල්. රාජදාස
තනතුර :ලේකම්,අභ්‍යන්තර වෙළඳ,ආහාර සුරක්ෂිතතාව හා පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය
දිනය : 24/02/2020

ජී. කේ. එස්. එල්. රාජදාස
ලේකම්
අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ
පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය
සතොස මහ ලේකම් කාර්යාලය,
නො. 27, වොක්ෂෝල් විදිය, කොළඹ 02.

.....
ගණන්දීමේ නිලධාරි
නම :සුවින්ද එස්. සිංගප්පුලි
තනතුර :සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
දිනය : 2020.02.20

සුවින්ද එස්. සිංගප්පුලි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
තැ.පෙ. 419, අංක: 330, යූනියන් පෙදෙස,
කොළඹ - 02.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ඒ.ජී.සෝමලතා
දිනය : 2020 ෆෙ. 20

ආගර ගේ සෝමලතා
ගණකාධිකාරි
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
තැ.පෙ. 419, අංක. 330, යූනියන් පෙදෙස,
කොළඹ - 02.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

එස්ඒ-සී

	ප්‍රත්‍ය	
	2019	**2018**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	3,949,287	1,832,083,177
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මඟින් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	208,725,150	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**212,674,437**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	71,017,006	84,561,323
සහනාධාර සහ මාරුකිරීම්	23,311,380	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	115,142,640	1,745,477,389
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**209,471,026**	**-**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**3,203,411**	**-**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	1,194,078	4,460,374
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**1,194,078**	**4,460,374**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	-	-
අත්තිකාරම් ගැනීම්	4,310,790	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,310,790**	**-**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(3,116,712)**	**4,460,374**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**86,699**	**4,460,374**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
නැන්පතු ලැබීම්	105,326	78,195
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**105,326**	**78,195**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-

තැන්පත්ගෙවීම්	134,620	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**134,620**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(29,294)**	**78,195**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**115,993**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**57,405**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත.අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා,මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ,පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ,පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ,පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනවල % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	75,000,000.00	76,300,000.00	75,657,818.97	99.15%
මූලධන	34,000,000.00	34,000,000.00	23,311,379.57	68.56%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වෙනත් වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	54,329,799	54,329,799		
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

01 JUL 2020

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඩී/සීඕඩීඩී/එෆ්ඒ/2019

ඔබේ අංකය / உமது இல. / Your No. }

සමූපකාර සංවර්ධන කොමසාරිස් 19 AUG 2020 (මුදල් ශාඛාව) කොළඹ - 02.

දිනය / திகதி / Date } 2020 ජූලි 01 දින

සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි

තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම්, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඔුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කළ යුතු රු.1,014,769 ක්වූ වත්කම් මිලදී ගැනීම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

1.6.2 නොසැසඳුණු වාර්තා

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුමේ සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ, 301012 යටතේ සඳහන් හරකිරීම් හා බැරකිරීම් වටිනාකම් අතර පිළිවෙලින් රු.344,417 සහ රු.197,611 ක වෙනසක් පැවතුනි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	2019 ජුනි 17 දිනැති අංක 04/2019 හා 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 05/2019 දරන අයවැය චක්‍රලේඛ	2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන ව්‍යයම් වලින් සියයට 25 ක් ඉතිරි කළ යුතු වුවද ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

කේ.කේ.වී.ධර්මසිරි

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුව

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100%-90%	75%-89%	50%-74%	වෙනත්
සමුපකාර සමිති විගණනය කිරීම				43%
සමුපකාර සමිති නිලවරණ පැවැත්වීම			71%	
සමුපකාර සමිති ලියාපදිංචි කිරීම				40%
මූල්‍ය නියාමන කමිටු පැවැත්වීම				25%
ආරවුල් බේරුම්කරණ තීන්දු ලබාදීම				135%
උසාවි දඩ මුදල් සමිති වෙත මුදා හැරීම				143%
සමුපදීපනී පුවත් අතිරේකය නිකුත් කිරීම	100%			
පුහුණු වැඩසටහන් පැවැත්වීම				25%
පාසැල, විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ තුළ සමුපකාර වෙළඳසැල් පිහිටුවීම				350%
දෙපාර්තමේන්තු පුරප්පාඩු සම්පූර්ණ කිරීම			50%	
දේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කිරීම	100%			
විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කිරීම	100%			
2018 කාර්යසාධන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම	100%			
සමුපකාර දින උළෙල පැවැත්වීම	100%			
සමුපකාර සුපිරි වෙළඳසැල් කාර්යමණ්ඩල සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්				800%
සමුපකාර සුපිරි වෙළඳසැල් නවීකරණය	100%			
පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සමුළු පැවැත්වීම	100%			

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%

06 පරිච්ඡේදය

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්	01	01	00
	නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II, III)	04	02* 01	03
	ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය III/ II)	02	01* 01	01
	නියෝජ්‍ය කොමසාරිස් /සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු ගත)	03	03	00
	නීති නිලධාරී (දෙපාර්තමේන්තු ගත)	01	00	01
	සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය)	01	01	00
	එකතුව	**12**	**ස්ථිර - 07** **කොන්ත්‍රාත් - 03***	**05**
තෘතීය මට්ටම	පරිපාලන නිලධාරී	01	01	00
	සමුපකාර සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය)	05	02 02**	03
	භාෂා පරිවර්තක	01	01*	01
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණ සේවය III, II)	02	00	02
	එකතුව	**09**	**ස්ථිර - 03** **කොන්ත්‍රාත් - 01** **රා.ආවරණ - 02**	**06**
ද්විතීය මට්ටම	සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර සමුපකාර සංවර්ධන නිලධාරී	37 25 } 62	19 30 } 48	13***
	සංවර්ධන නිලධාරී	15	ස්ථිර - 12 අභ්‍යාසලාභී - 03	00
	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර (ශ්‍රී ලංකා තොරතුරු ය(III, II)	05	02	03
	රාජ්‍ය කළමනාකරණ සහකාර	28	20	08
	එකතුව	**110**	**86**	**24**
ප්‍රාථමික මට්ටම	රියදුරු	05	04	01
	කාර්යාල කාර්ය සහයක	15	10	05
	එකතුව	**20**	**14**	**06**
මුළු එකතුව		**151**	**116**	**41**

* කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් විශ්‍රාමික ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් දෙදෙනෙකු, ගණකාධිකාරී සේවයේ නිලධාරිනියක සහ භාෂා පරිවර්තක නිලධාරියෙකු එම රාජකාරී කටයුතු ඉටු කරනු ලබයි.

**සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය පුරප්පාඩු 03න් පුරප්පාඩු 02ක් සඳහා සමුපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරිනියන් දෙදෙනෙක් රාජකාරී ආවරණය කරනු ලබයි.

*** සමූපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර තනතුරු පුරප්පාඩු සඳහා ඉදිරියේදී බඳවා ගැනීම් සිදු නොකිරීමත් එමගින් ඇති වන පුරප්පාඩු සඳහා සමූපකාර සංවර්ධන නිලධාරීවරුන් බඳවා ගැනීමත් අනුමත කර ඇති ඇති බැවින් සමූපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර සහ සමූපකාර සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව 62 ක් වශයෙන් පවත්වාගෙන යා යුතුය.

6.2 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීති භාවිතය	04	දින 02			දේශීය	
සරප් මුදල් අයකැමි තනතුරේ කාර්ය භාරය	02	දින 01			දේශීය	
පුද්ගලික ලිපි ගොනුවක් පවත්වා ගෙන යාම	04	දින 02			දේශීය	
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	03	දින 02			දේශීය	
ප්‍රවාහන කළමනාකරණය	01	දින 02			දේශීය	
රාජ්‍ය ආයතන වල විගණන ප්‍රශ්න අවම කර ගන්නේ කෙසේද?	05	දින 02			දේශීය	
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	02	දින 10			දේශීය	
රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු විධිවිධාන	01	දින 02			දේශීය	
රාජ්‍ය ආයතන වල අවසාන ගිණුම් පිළියෙල කිරීම	02	දින 02			දේශීය	
රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයන් සඳහා විනය කාර්යාලීය ආචාර විධි	01	දින 02			දේශීය	
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම	02	දින 01			දේශීය	
විගණන පුහුණුව	05	දින 02			දේශීය	
කාර්යාල කාර්ය සහායක පුහුණුව	02	දින 02			දේශීය	
International Programme on "Women's Development through income generating (Activities)	02	දින 04			විදේශීය	
Skill Development of Trainers in the area of Promotion and Financing of SHGS & JLGS for Financial Inclusion of Rural poor.	02	දින 04			විදේශීය	
NEDAC new executive committee (ExCom)	01	දින 04			විදේශීය	

International Programme on Financing Small Enterprises for Rural Development	02	සති 02			විදේශීය	
2019 China Trade Conference Organized by WFP	01	දින 04			විදේශීය	
Family Farmers Cooperatives to End Hunger and Poverty through Integrated Farming in south Asia	01	දින 04			විදේශීය	
CICTAB 50th Managing Committee Meeting	01	දින 01			විදේශීය	
NEDAC International Co-operative Trade Fair	01	දින 02			විදේශීය	
International Programme on “Digitalization and Financial Inclusion for CEOs and Senior Executives 18th – 22nd November”	01	දින 06			විදේශීය	
නායකත්වය හා ආකල්ප සංවර්ධන වැඩසටහන	සියලුම නිලධාරීන්	දින 02			දේශීය	
ධනාත්මක චින්තන හා ආකල්ප වැඩසටහන	සියලුම නිලධාරීන්	දින 01			දේශීය	
වරලත් ගණකාධිකරණ ආයතනය විසින් පවත්වනු ලබු විගණන පුහුණුව	සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්	දින 03			දේශීය	

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතන තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ		දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණන අංශයක් 2019 අගෝස්තු මස සිට ස්ථාපනය කල බැවින් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කර නොතිබිණි.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වරයාට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ		අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී තිබීම. අභ්‍යන්තර විගණන අංශය 2019 අගෝස්තු මස සිට ස්ථාපනය කිරීම හේතුවෙන් පැවැත්වීමට නොහැකි වී ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඊහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත් කිර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ	අනුකූල වේ		

	චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම			
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රදිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලේචිත වර්ෂය අවසානයේ දී මුදල්	අනුකූල වේ		

	පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම			
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.317 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම්	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන්සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		